චක්‍ර ලේඛ අංක: ***08/2004***

සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක 50, තිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.12.27

සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් බැංකු සංගම්,
සමුපකාර ණය දෙන සමිතිවල,
සභාපතිවරුන් වෙත,

මහත්මයාණෙනි,

<u>පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී පළපුරුද්ද ලෙස</u>
<u>ගණන් ගැනෙන කාල සීමාව ගණනය කිරීම</u>

සමුපකාර සමිති විසින් අභ්‍යන්තර සේවකයන් මගින් ස්ථිර පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී නොයෙක් අවස්ථාවල කොමිෂන් සභා අනුමැතියකින් තොරව තාවකාලික හෝ එසේත් නැතහොත් අනියම් පදනම මත හෝ බඳවා ගෙන සිටියේ යැයි සඳහන් කරමින් එම කාලසීමාව පළපුරුද්ද ලෙස සලකා ස්ථිර පත්වීම් ලබා දෙන ලෙස ඉල්ලීම් කරනු ලැබේ.

02. එබඳු ඉල්ලීම් සමග ඉදිරිපත් කරන ලිපි ලේඛණ සමග කොමිෂන් සභා අනුමැතිය ලත් ලිපිලේඛන කිසිවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එම සේවකයන්ගේ සේවා කාලය පිළිබඳ සෑහීමකට පත් වීමට කොමිෂන් සභාවට නොහැකි බව කොමිෂන් සභාවේ නිගමනය වී ඇත.

03. එබැවින් මින් ඉදිරියට කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව කුමන පදනමකින් හෝ බඳවා ගෙන ඇති සේවකයින් ගේ සේවා කාලය පළපුරුද්ද සේ සැලකීමට කොමිෂන් සභාව කටයුතු නොකරන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙමි.

මෙයට - විශ්වාසී,

කේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලි බල අමාත්‍ය තුමා ගේ සම්බන්ධීකරණ නිලධාරි
2. ප්‍රධාන ලේකම් (බ.ප.)